මැද පෙරදිග කැළඹීම සහ ශ්‍රීලංකාව

1 පිටුවෙන්.....

දැවැන්ත වෙළඳ ගිවිසුමකට අත්සන් තැබුවේය. එහි වටිනාකම ඩොලර් බිලියන 1.5 ක් බව කියති. එසේම බ්‍රිතාන්‍ය යුද නිලධාරීන් යවා ගඩාෆිගේ හමුදාවන් පුහුණු කරන්නටද බ්ලෙයාර් පොරොන්දු වී ඇති බව හෙළිවීය.

ටෝනි බ්ලෙයාර් ට පසුව අගමැතිකමට පත්වූ ගෝඩන් බ්‍රවුන්ද ගඩාෆි හා හාදවිය. මේ සියල්ලට මූලික වූයේ බ්‍රිතාන්‍යයේ ගරා වැටෙන ආර්ථිකය ඔසවා තබන්නට ලිබියාව සමග ඛණිජ තෙල් ආශ්‍රයෙන් වෙළඳ වාසි ලැබීම පිණිස ය. මේ බව මනාව පැහැදිලි වූයේ ලොකර්බි බෝම්බ ප්‍රහාරයට බ්‍රිතාන්‍යයේ සිරකරගෙන සිටි ලිබියානු ජාතිකයා ගිය වසරේ නිදහස්කර යැවීමෙනි. ඔහුට පිළිකාවක් වැළඳී තිබුණු බවටද කතාවකි පැතිරිණ. එහිදී බ්‍රිතාන්‍ය රජය ලෝකයාට පෙන්නුවේ මානුෂිකව සිතා එසේ කළ බවයි. එහෙත් දන්නෝ දනිති. මේ ගනුදෙනුව දෙරට අතර සම්පූර්ණ කළේ මෙහි විදේශ අමාත්‍යංශ යයි. ඇමරිකාව හා එංගලන්තය ගඩාෆි යළිත් බදා වැළඳ ගැනීම යනු බටහිර නිරුවත ලොවට කියාපෑමකි.

බටහිර අභිප්‍රායයන්

අමරිකා එක්සත් ජනපදය චීනයට මහා ප්‍රමාණයෙන් ණය වී සිටින බව කවුරුත් පාහේ දන්නා සත්‍යයකි. මේ ණයෙහි විශාලත්වය ඩොලර් බිලියන නොව ට්‍රිලි යන ප්‍රමාණයකි. (ට්‍රිලියනයක් යනු එකයි බින්දු දොළහකි. 1,000000000000) යම් හෙයකින් චීනය මේ මහා ණය ප්‍රමාණය ගෙවන ලෙස අද ඇමරිකවෙන් ඉල්ලා සිටියොත් ඇමරිකාවට යන එන මං නැතිවෙනවා ඇත. එහි ආර්ථිකය බිංදුව ටම වැටෙනවා නියතය. එහෙත් චීනය එසේ නොකරන්නේ ඇමරිකාව ඔවුන්ගේ විශාලතම වෙළඳපොළ වන බැවිනි. චීනය නිපදවන බොහෝ දේ අද ඇමරිකාව මිළට ගනියි. ඒවා නැතිව බැරිය

චීන ආර්ථිකය අද ලෝකයේ දෙවන මහා ආර්ථිකය ලෙස සැලකේ. චීනය එය තවත් ඉදිරියට ගෙන යමින් ඇමරිකාවද පරදවා මුල් තැනට පැමිණ ලෝකයේම ශක්තිමත් ආර්ථිකය බවට පත්වන්නට තව වැඩි කලක් යන්නේ නැත.

ඇමරිකාව සහ බ්‍රිතාන්‍යයට අද සිදුව ඇත්තේ බංකොලොත් භාවයෙන් මිදෙන්නට සහ ආර්ථික උද්ධමනයෙන් ගොඩ එන්නට මගක් සොයන වැයමක යෙදෙන්නටය. මෙහිදී ලොකුම ප්‍රශ්නය වී ඇත්තේ මේ දෙරටම ලෝක වෙළඳපොළ සඳහා කිසිම දෙයක් නිශ්පාදනය නොකිරීමයි. සියල්ල නිපදවන්නේ චීනයයි. ඉන්දියාවද දැන් හොඳ නිෂ්පාදකයෙකු මෙන්ම ආර්ථික බලයක් බවටද පත්වෙමින් සිටියි.

ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය මහා පරිමාණයෙන් කරන නිෂ්පාදනයක් වේ නම් ඒ අවි ආයුධ සහ වෙනත් යුද ආම්පන්න ය. ලොව විශාලතම ආයුධ ප්‍රදර්ශණය වාර්ෂිකව පවත්වන්නේ නිව්යෝර්ක් නගරයේ සහ ලන්ඩනයේ බව බෙහෝදෙනා දනිති. ආයුධ නිෂ්පාදනයේ 90% ක්ම ඔවුන්ගෙන් සිදුවන අතර ඉතිරි 10% චීනය, රුසියාව, ඊශ්‍රායලය, දකුණු කොරියාව සහ ඉන්දියාව මගින් සිදුවෙයි. අප්‍රිකාව සහ දකුණු ඇමරිකාව කිසිවක් නිපදවන්නේ නැත.

දැන් පැහැදැලි වන්නේ ලෝකයේ කුමන තැනක වුවද පවතින නොසන්සුන්තාවන් හා කළබල මේ ගිජුලිහිණියන්ට දෙයියෝ දුන් මහඟු අවස්ථා බවට පත්වන බවයි. මැද පෙරදිග දැන් ඔවුන්ට ඇරී ඇත්තේ එවැනි ඉඩකි.

ආයුධ ලෙලවන ශබ්දය

පසුගිය සතිවල ඇමරිකාවේ සහ බ්‍රිතාන්‍යයේ ක්‍රියාදාමයන් පෙන්නුම් කළේ ඒ දෙරට ඒ අවස්ථාවට සූදානම් වන බවකි. මෙය හදිසියේ මතුවූ දෙයක් නොව සී අයි ඒ ආදී ඔවුන්ගේ රහස් ඔත්තු සේවය මගින් වසර කීපයක් තිස්සේ උපායශීලීව නිර්මාණය කළ තත්වයකි. දැන් විවෘතවම ඔවුන් යුද්ධයකට සූදානම් ය.

බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන් නොබෝදා මැදපෙරදිග සංචාරයකට ගියේ සාම ගනුදෙනුවකට යන නියෝජිත පිරිසක් කැටිව නොවේ. ඔහු සමග ගියේ

ඔබාමා ගිය වසරේ ගඩාෆි හමුවූ අවස්ථාව

හිටපු අගමැති ටෝනි බ්ලෙයාර් ගඩාෆි හමුවූ අවස්ථාව

යුද ආයුධ වෙළෙන්දන් පිරිසකි. ඒ අනාගතයේ ආයුධ අළෙවියකට ඉඩ සළසාගන්නටය. ගිය දශකය පුරාම බ්ලෙයාර් සහ බුෂ් දෙදෙනා මැද පෙරදිගට ගෙනා නස්පැත්තිය අපි හොදාකාර දුටුවෙමු. දැන් ඔබාමා, හිලරි ක්ලින්ටන් සහ කැමරන් ද තම පියවරවල් ගන්නට සූදානම්න් සිටිති.

ඇමරිකාව දැන් යුද්ධයකට සම්පූර්ණ සූදානමකින් යුතුව සූවස් ඇල මායිමට යුද නැවක් යවා ඇත. කියන්නේ නම් ගඩාෆි හමුදාවන්ගේ අතවරවලින් අහිංසක ලිබියානු ජනතාව මුදාගැන්මට බවයි. නමුත් ඒ මුදා ගන්නට සැරසෙන ජනතාව යම් හෙයකින් ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය තම රට ආක්‍රමණය කරනවා සේ සලකා විරුද්ධව හැරුණොත් ඔවුන් දෙසටද ඒ ඇමරිකන් තුවක්කු හැරෙනවා ඇත.

මෙය ඔවුන්ට දෙවියන් දුන් වරමක් වැනිය. අරාබිකරයට යුද නැවක් යවන්නට සහ ඒ පැත්තට අත දාන්නේ කොහොමදැයි සිත සිත සිටි ඇමරිකාවට ඒ අවස්ථාව උදාවිය. ඊශ්‍රායලයට පිහිටවන්නේ කොහොමදැයි මුල සිටම ඔවුන් හිත හිත හිටි නමුත් එයටද දැන් පොටක් පැදිණ. එසේම දැන් මොවුන් ප්‍රාර්ථනාකරනේ මේ කැළඹුණු අරාබිකාර කණ්ඩායම් එකිනෙකාගේ බෙල්ල මිරිකා ගැන්මටත් යොමුවේවා කියායි. එවිට ආයුධ වෙළඳාමට මොනතරම් පහසුද? එමගින්ම ඇමරිකාවට අරාබිකරයේ පොලිස්කාරයා වෙන්නටද ඉඩ සැලසෙන්නේය.

ඒ සමගම වංචාකාරී ලෙස ලිබියාවේ සමෘධිමත් තෙල් සහ ගෑස් ව්‍යාපෘති වලටද අත දැමිය හැකි වන්නේය. මොවුන්ගේ මූලික පරමාර්ථ මේවා මිස මැදපෙරදිග වැසියන් වෙත ප්‍රජාතන්ත්‍රය, මානව හිමිකම් සහ සාධාරණත්වය ගෙනෙන්නට නොවේ. යථාර්ථය නම් මෙයයි.

මෙම අවුල ශ්‍රීලංකාවට බලපාන හැටි

ඉහතකී අර්බුදය ක්ෂණික වශයෙන් අප රටේ තෙල් මිළ ඉහළ යාමට හේතුවන බව පැහැදිලිය. බටහිර මෙය දැනටම සිදුවෙයි. පලාත් පාලන ඡන්දය අවසන් වනතුරු මිළ වැඩි කිරීම රජය නවත්වාගෙන ඉඳී. එහෙත් ඡන්දය අවසන් වූ විගස තෙල් මිළ පමණක් නොව අනෙක් බඩුවල මිළද ඉහළ දානවා නිසැකය.

තවත් බරපතල ප්‍රශ්නයක් වන්නේ මැදපෙරදිග රැකියාවට ගොස් සිටින අපේ ජනතාවගේ රැකියාවන්ට කුමක් වේද යන්නය. මෙයට කලක් ගත විය හැකි නමුත් දැනටම ලිබියාවේ සිට අපේ අය ජීවිතාරක්ෂාව පතා ගමරට බලා එනු පෙනේ. මේ තත්වය බරපතල ලෙස අප රටේ ආර්ථිකයට බලපානවා ඇත. අපට විදේශ විනිමය සපයන්නේ අපේ රජයයන් විසින් අපේ කාන්තාවන් මැද පෙරදිග බැලමෙහෙවරට යැවීමෙන් බව අප කවුරුත් දන්නා සත්‍යයකි. ඒ උපයන විනිමය යොදවා අපේ දේශපාලකයින් ප්‍රාඩෝ BMW ආදී නවීන වාහන ගෙන්වමින් කරන නැති නාස්තිය අපි කීප විටක් පෙන්නා දුන්නෙමු.

තවද අපේ රටින් මැද පෙරදිගට බුලත් පුවක් සහ අළුත් එළවළු සහ පළතුරු යැවීමේ වෙළඳ පොළද මේ අර්බුදය නිසා අනතුරට වැටෙනවා ඇත.

අවාසනාවට අප රටේ පුවත්පත් සහ මාධ්‍යය රට මුහුණ පාන අනතුරුදායක තත්වය ගැන කිසිවක් කතාබහ කරනු නොඇසේ. ඔවුන් තවම කරන්නේ බටහිර මාධ්‍යය අරාබි අර්බුදය ගැන දෙන උද්වේගකර විස්තර ඒ අයුරින් පළකර පෙන්වීම පමණකි. රජයද වැඩිදුර මේ ගැන කතා නොකරයි. සමහර විට එයින් ඉදිරියේ පවත්වන පළාත් පාලන මැතිවරණයේදී තමනට ඉන් පාඩුවක් සිදුවේයයි සිතන නිසා විය හැකිය.

මේ කාරණයේදී විපක්ෂයේ දේශපාලකයන් ක්‍රියාකරන ආකාරය මහ විකාර ස්වරූපයක් උසුලයි. විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ කරන්නේ අරාබි පාලකයන්ට සිදුව ඇති දෙය

ලංකාවේ රාජපක්ෂ රජය සමග සංසන්දය කිරීමයි. ඔහු ගත් කටටම කීවේ ඊජිප්තුවේ මුබාරක්ට සහ තුනීසියාවේ බෙන් අලිට වූදේ මහින්ද රාජපක්ෂට ද ළඟදීම සිදුවන බවය. ලංකාවේ ජනතාව එකතුව මහින්ද එළවා දැමීමට අරාබියේ මෙන් උද්ඝෝෂණ කළ යුතු යයි රනිල් කියයි. ඔහු ඒ තත්වය බලාපොරොත්තු සිටියි.

ජනතා විමුක්ති පෙරමුණ ද ශබ්ද නගා කියන්නේ කොළඹ ලිප්ටන් වටරවුම කයිරෝ හි තාහිරීර් වටරවුම බවට නුදුරේදී ම පෙරලෙනවා ඇත යන්නයි. එහෙත් ඔවුන් ඒ දෙසට ජනතාව පෙළගස්වා ගෙනයන්නට මූලිකත්වය ගන්නා බවක් නොපෙනේ. රජය පෙරලන්නට යත්න දරන මේ කිසිවෙකු මැද පෙරදිග හා අප රට අතර ඇති වෙනස තේරුම් ගෙන නැත.

1. ඒ අරාබි රටවල ඒකාධිපති පාලක යෝ තම අභිමත පරිදි පාලනය එක දිගට අවුරුදු තිස්, හතළිස් ගණන් ගෙනගිය අය වෙති. ඒ රටවල කිසිදා ඡන්දයක්, මැතිවරණයක් පවත්වා නැත. එහෙත් ශ්‍රීලංකාවේ තත්වය එසේ නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිරන්තරයෙන් මැතිවරණ පවත්වා ඇත. කිසිදු මැතිවරණයක් අවලංගු කර නොමැත.

2. ඒ රටවල ජනයාගේ සාක්ෂරතාව හෙවත් උගත්කම හෝ ලියන්නට කියවන්නට ඇති දැනුම **30%** ටත් අඩු ය. එහෙත් ශ්‍රීලංකාවේ ජනගහනයේ සාක්ෂරතාව **90%** ටත් ඉහළ ය.

3. අප රටේ බොහෝ ප්‍රාණවත්, එමෙන්ම විවිධත්වයෙන් යුත් මාධ්‍ය ක්‍රමයක් ද, නොයෙක් පුවත්පත් හා සඟරා ආදියත්, ගුවන්විදුලිය හා රූපවාහිනී නාලිකාත් ඇත. එහෙත් ඒ අරාබි රටවල එවැනි විපුල ජන මාධ්‍යයක් නොමැත. මඳක් හෝ ඇත් නම් ඒ ප්‍රධාන නගරවල පමණකි

4. මැද පෙරදිග රටවල ධනවත් කීප දෙනා සහ බහුතරයක් වන දිළිඳු ජනයා අතර පරතරය ඉතා විශාලය. ශ්‍රීලංකාවේ මෙන් නොව, ඒ දිළිඳු බහුතරය සමාජීය හෝ දේශපාලනික දැනුමෙන් හීන වෙමින් නූගත්කම මෙන්ම ආගමික උමතු බවෙන් ද පිරී සිටින අය වෙති. ඒ රටවල ගම්බද සහ නගරබද ජනතාව අතර හැම අතින්ම කැපී පෙනෙන දැඩි වෙනසක් ඒ මිනිසුන්ගේ දිවිපෙවෙතේ දක්නට ඇත. ශ්‍රීලංකාවේ එවැනි වෙනසක් ඒ කොටස් දෙක අතර දක්නට නැත. (මේ ලියන මා ඊජිප්තුවේ කීප වරක් සංචාරය කර ඇති බැවින් මේ බව හොඳින් දැක දැන සිටිමි)

ශ්‍රීලංකාවේ දැන් පවතින රජය බලයෙන් පහකරන්නට අවශ්‍ය නම් විපක්ෂය කළ යුත්තේ ක්‍රමවත් ඵලදායී වැඩ පිළිවෙලක් ඔස්සේ ජනතාව දැනුවත් කරමින් ඔවුන්ට නායකත්වය දෙමින් ඔවුන් ඉදිරියට මෙහෙය වීමය. එහෙත් ඒ කාර්‍යය ඔවුන් කරන බවක් වත්, ජනතාව ඔවුන් විශ්වාස කරන බවක් වත් පෙනෙන්ට නැත. ඒ නිසා විපක්ෂය හා කොටි සංවිධානයද දෙමළ ඩයස්පෝරාවද බලාපොරොත්තු වන්නේත්, හඬ නගන්නේත්, බලාගෙන ඉන්නේත් කුමන හෝ බටහිර රටක් මැදහත් වී ලංකාවේ පවතින රජය එළවා දමා තමනට බලය ලබා දෙන තෙක්ය. ඒ කාර්‍යය කරගන්නට මුළු රටම වුවද පිට රටට පාවා දෙන්නට ඔව්හු කිසිසේත් පසුබට නොවෙති. මෙය අපේ ඉතිහාසයේ බොහෝ වාරයක් සිදුවී තිබේ.

විරෝධ ආපි....එහෙත් යයිද ගඩාෆි?

NEWS LONDON :

Colonel Muammar Gaddafi has hinted that he is ready to quit Libya after 41 years in power, only if rebel interim council gives him a pile of cash and assures him immunity from criminal prosecution, a media report said.

But this news report is denied by the pro-Gaddafi camp. They said their leader would never bow down to the pressure created by the West nor would he leave his land, Libya.

ලිබියානු නායක මුහම්මර් ගඩාෆි ගැන නොයෙක් පුවත් මේ දිනවල ලොව පුරා පළ වෙයි. එහෙත් ඒවා සම්පූර්ණ ඇත්දැයි නිශ්චිත වශයෙන් කිව නොහැකිය. එක් පළවූ පුවතක් නම් ගඩාෆි පිටව යන්නට කැමති බව ය. විශාල මුදල් ගොඩක් සමග පිටව යන්නටත්, ඒ ගිය පසු තමාට එරෙහිව නීතිමය පියවර නොගන්නා බවටත් පොරොන්දු වන්නේ නම් තමා යන්නට සූදානම් බව තම නිලධාරියෙකුගේ මාර්ග යෙන් ඔහුට එරෙහි උද්ඝෝෂක කණ්ඩායම්වලට දන්වා ඇතැයි කියන මුත් ගඩාෆිගේ පැත් තෙන් කියන්නේ එය අමූලික බොරුවක් බවයි. තමා දුර්වල කරන්නට බටහිර මාධ්‍යය ගොතන කතා බව ඔව්හු කියති.

තමාට එරෙහිව හඬ නගන ලිබියානුන් ගඩාෆි විසින් හඳුන්වන ලද්දේ කැරපොත්තන් ලෙසිනි. “ මම අපේ හමුදාවන්ට කියන්නෙ ගිහිං ඔය කැරපොත්තො ටික තලලා කුඩුකරලා දාන්නයි කියලා ” ගඩාෆි කීවේය.